

# 6 ශ්‍රේණිය - 3 වන සතිය

**පාඩම :- පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම**
**කාලච්ඡේද ගණන :- 10**




23



31


ඉහත එක් එක් ගණක රාමුවල එකස්ථානයේ තිබෙන ගණක සියල්ල වෙනමත් දසස්ථානයේ තිබෙන ගණක සියල්ල වෙනමත් පහත දැක්වෙන ගණක රාමුවට දමමු. ලැබෙන සංඛ්‍යාව ගණක රාමුව අනුව ලියන්න.




ඒ අනුව, 23 + 31 = ☐ හිස් කොටුව තුල අගය ලියන්න.

පහත දැක්වෙන සංඛ්‍යාවල එකතුව ගණක රාමු මඟින් නිරූපණය කර පිළිතුර ලියන්න.

උදා:-



21 13 34

1) 52 + 13
2) 41 + 32
3) 24 + 23

පෙළපොතේ 21 හා 22 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.

පෙළපොතේ 23 පිටුව බලන්න. සංඛ්‍යා දෙකක් එකතු කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය අවබෝධ කරගන්න.

පහත දැක්වෙන උදාහරණ දෙක හොඳින් අධ්‍යයනය කරන්න.

```
  674
+ 289
  963
```

```
  3452
  2448
+ 1396
  7296
```

පෙළපොතේ 24 පිටුවෙහි 3.1 අභ්‍යාසය බලන්න. එහි පළමුවන ප්‍රශ්නය නිවැරදිව සුළු කරන්න.

> සංඛ්‍යා එකතු කිරීමේදී එකස්ථානයේ ඉලක්කම් එක තීරුවකටද දසස්ථානයේ ඉලක්කම් එක තීරුවකටද සියස්ථානයේ ඉලක්කම් එක තීරුවකටද ආදී වශයෙන් වන පරිදි සංඛ්‍යා ලියාගෙන එකතු කල යුතුය.

- හිස් කොටු පුරවන්න.

437 + 321 = ☐

212 + 324 = ☐

☐ + ☐ = ☐

පෙළපොතේ 24 පිටුවෙහි 3.1 අභ්‍යාසයේ ඉතිරි ගැටළු සම්පූර්ණ කරන්න.

පූර්ණ සංඛ්‍යාවකින් ඊට වඩා කුඩා පූර්ණ සංඛ්‍යාවක් අඩු කිරීම පිළිබඳ පහත නිදසුනෙහි පියවර හොඳින් අධ්‍යයනය කරන්න.

8763 න් 1874 ක් අඩු කරමු.

1 වන පියවර

```
     5 13
  8 7 6 3      (6 crossed out)
- 1 8 7 4
        9
```

2 වන පියවර

```
   6 15 13
  8 7 6 3      (7, 6 crossed out)
- 1 8 7 4
      8 9
```

3 වන පියවර

```
  16 15 13
  8 7 6 3      (8, 7, 6 crossed out)
- 1 8 7 4
    8 8 9
```

4 වන පියවර

```
 7 16 15 13
  8 7 6 3      (8, 7, 6 crossed out)
- 1 8 7 4
  6 8 8 9
```

පෙළපොතේ 25,26,27 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. පූර්ණ සංඛ්‍යාවකින් ඊට වඩා කුඩා පූර්ණ සංඛ්‍යාවක් අඩු කිරීම පිළිබඳ හොඳින් අධ්‍යයනය කරන්න.

පෙළපොතේ 27 පිටුවෙහි 3.2 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.


පූර්ණ සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 28,29 පිටු කියවා හොඳින් අධ්‍යයනය කරන්න.


- පහත දැක්වෙන ගුණන වගුව සම්පූර්ණ කරන්න.

| x | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 1 | | | | 3 | | | | | | | | | |
| 2 | | | | 6 | | | | | | | | | |
| 3 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 |
| 4 | | | | 12 | | | | | | | | | |
| 5 | | | | 15 | | | | | | | | | |
| 6 | | | | 18 | | | | | | | | | |
| 7 | | | | 21 | | | | | | | | | |
| 8 | | | | 24 | | | | | | | | | |
| 9 | | | | 27 | | | | | | | | | |
| 10 | | | | 30 | | | | | | | | | |
| 11 | | | | 33 | | | | | | | | | |
| 12 | | | | 36 | | | | | | | | | |

ගුණන වගුව භාවිතයෙන් පහත හිස් තැන් සඳහා සුදුසු අගය ලියන්න.

1)




පෙළපොතේ 30 පිටුවෙහි 3.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

පූර්ණ සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 30 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් ගුණ කිරීමේදී ලැබෙන පිළිතුර පළමු සංඛ්‍යාවේ දකුණු පසට යෙදෙන බින්දු ගණන ඇසුරින් අවබෝධ කරගන්න.

- පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| 3 x 10 | 30 |
| 7 x 10 | |
| 2 x 100 | |
| 15 x 100 | |
| 2 x 1000 | 2000 |
| 8 x 1000 | |
| 13 x 1000 | |

පෙළපොතේ 32 පිටුවෙහි 3.4 අභ්‍යාසයේ පළමුවන ප්‍රශ්නය නිවැරදිව සම්පූර්ණ කරන්න.

සංඛ්‍යා දෙකක ගුණිතය සෙවීමේදී විශාල සංඛ්‍යාව කුඩා සංඛ්‍යාවෙන් ගුණ කල යුතුය.

පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම පිළිබඳව පෙළපොතේ 31 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. පහත නිදසුන් ද අවබෝධ කරගන්න.

```
    7 4
  x 3 7
  -------
    5 1 8  <-- 74 x 7 = 518
  2 2 2 0  <-- 74 x 30 = 2220
  -------
  2 7 3 8
  =======
```

```
   1 5 3
  x  6 5
  -------
   7 6 5  <-- 153 x 5 = 765
 9 1 8 0  <-- 153 x 60 = 9180
  -------
 9 9 4 5
  =======
```

පෙළපොතේ 32 පිටුවෙහි 3.4 අභ්‍යාසයේ 2,3,4,5,6,7 ප්‍රශ්න නිවැරදිව සම්පූර්ණ කරන්න.

පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් බෙදීම පිළිබඳව පෙළපොතේ 36 පිටුව කියවා අවබෝධ කරගන්න.

- ලබ්ධිය හා ශේෂය යනු කුමක්දැයි හඳුන්වන්න.

පහත දැක්වෙන උදාහරණ නිවැරදිව අධ්‍යයනය කරන්න.

$40 \div 10 = 4$
$500 \div 10 = 50$
$300 \div 100 = 3$
$8000 \div 100 = 80$
$5000 \div 1000 = 5$
$50000 \div 1000 = 50$

ඉහත උදාහරණ අනුව පූර්ණ සංඛ්‍යාවක් 10 න් 100 න් 1000 න් බෙදීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පිලිවෙල පෙලපොතේ 34 පිටුව අධ්‍යයනය කර තවදුරටත් තහවුරු කරගන්න.

පහත දැක්වෙන උදාහරණ නිවැරදිව අධ්‍යයනය කරන්න.

$525 \div 7$

$$\begin{array}{r|l}
 & \;\;75 \\ \hline
7 & 5\,2\,5 \\
 & 49 \qquad 7x7 = 49 \\ \hline
 & \;35 \\
 & \;35 \qquad 7x5 = 35 \\ \hline
 & \;\;0
\end{array}$$

$525 \div 7 = 75$

$519 \div 12$

$$\begin{array}{r|l}
 & \;\;43 \\ \hline
12 & 519 \\
 & 48 \qquad 12x4 = 48 \\ \hline
 & \;39 \\
 & \;36 \qquad 12x3 = 36 \\ \hline
 & \;\;3
\end{array}$$

$519 \div 12$ = 43 යි ඉතිරි 3 යි.

| පූර්ණ සංඛ්‍යාවක් තවත් පූර්ණ සංඛ්‍යාවකින් බෙදීමට දීර්ඝ බෙදීමේ ක්‍රමය යොදාගත හැක. |
|---|

- පෙළපොතේ 36 පිටුවේ නිදසුන 1 තවදුරටත් අධ්‍යයනය කරන්න.
- පෙළපොතේ 36 පිටුවෙහි 3.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.